## සමූහ කළමනාකාර අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරීගේ පණිවිඩය

**හිතවත් පාර්ශ්වකරුවන් වෙත,**

"නොනවතින ගමන් මග" යන තේමාව යටතේ ඉදිරිපත් කෙරෙන DIMOහි 2024/25 වාර්ෂික වාර්තාව සමගින් මා ඔබව ආමන්ත්‍රණය කරන්නේ විශ්වාසයෙන් සහ ස්ථිරසාර බවින් පිරුණු හැඟීමකිනි. මූල්‍යමය කාර්යසාධනය අතින් ගත් කල, මෙය අප සමාගමේ ඉතිහාසයෙහි අතිශය දුෂ්කර වර්ෂවලින් එකකි. එහෙත් මේ වන විට අපි එම අභියෝගාත්මක තත්ත්වයෙන් මිදී තිරසාර පරිවර්තනයක් සඳහා අවශ්‍ය පදනම දමමින් අපි වඩාත් ශක්තිමත්ව නැගී සිටින්නෙමු.

මෙම වසර පුරාවටම ආර්ථික අස්ථාවරත්වය දිගින් දිගටම පැවතුණි. 2024 වසරේදී සාර්ව ආර්ථිකය යථා තත්ත්වයට පත් වන බවට ඉඟි සංචාරක සහ ඉදිකිරීම් වැනි ක්ෂේත්‍රවලින් පෙන්නුම් කළද, සමස්තයක් ලෙස ගෘහ ආදායම, රැකියා නියුක්තිය සහ පොදු සුබසාධනය අර්බුදයට පෙර පැවති තත්ත්වයට වඩා පහළ මට්ටමක පැවතුණි. ජාතික දරිද්‍රතා අනුපාතය ඉහළ මට්ටමක පැවති අතර, මෙම සමාජ ආර්ථික අභියෝග අපගේ වෙළඳපොළ කෙරෙහි, විශේෂයෙන්ම වාහන අලෙවිය කෙරෙහි සෘජුවම බලපාන ලදී. වාහන ආනයනයට පනවා තිබූ තහනම ඉවත් කිරීම යම් සහනයක් ඇති කළ නමුත්, අධික ආනයන තීරුබදු නිසා මිලදී ගැනීමේ හැකියාවට හා ඉල්ලුමට එය අඛණ්ඩව බලපෑමක් ඇති කරන ලදී.

මෙම තත්ත්වයන් එසේ තිබියදීත්, දිගුකාලීන වටිනාකම් නිර්මාණය කෙරෙහි අපගේ අවධානය යොමු කළෙමු. අපගේ දරාගැනීමේ හැකියාව සහ කොටස්කරුවන්ගේ වටිනාකම් වෙනුවෙන් ඇති කැපවීම යළි තහවුරු කරමින් අපි ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ, ඩිජිටල් පරිවර්තනය සහ අනාගතය ඉලක්ක කරගත් ප්‍රවේශයන් ඉදිරියට රැගෙන ගියෙමු.

මෙම වසරේ අප මූල්‍ය පාඩුවක් වාර්තා කළද, ඉදිරි වසරවලදී තිරසාර වර්ධනයක් සහතික කිරීම සඳහා මෙම වසර තුළ ගොඩනගන ලද ලද අර්ථවත් පදනම පිළිබඳව අපි ආඩම්බර වන්නෙමු. මෙම වාර්තාව එම ගමනේදී මෙන්ම අප කරන සියල්ල සඳහා "පරිපූර්ණ සහකරු" වීම උදෙසා අප විසින් කරනු ලබන කැපවීම පෙන්නුම් කරන්නකි.

**අපගේ නොනැසෙන අරමුණ**

"සිහින සහ අභිලාෂයන් පණ ගැන්වීම" යන අපගේ අරමුණට සහ "පරිපූර්ණ සහකරු" වීම පිළිබඳ අපගේ සන්නාම පොරොන්දුවට අප නිරන්තරයෙන් කැපවී සිටින්නෙමු. මෙම ප්‍රතිපත්ති අපගේ උපායමාර්ගික පෙළගැස්ම සහ කොටස්කරුවන් සමඟ ඇති සම්බන්ධතා මෙහෙයවනු ලබයි. අපගේ මෙහෙයුම් සන්දර්භය තුළ සිදුවන වෙනස්කම් හඳුනා ගනිමින්, අපි අපගේ ප්‍රධාන උපායමාර්ගික පදනම් ත්‍රිත්වය වෙනුවෙන් අඛණ්ඩව කැපවී සිටින්නෙමු. විවිධාංගීකරණය, වෙනස්කම් හඳුනාගැනීම සහ සහයෝගීතාව යන එම පදනම් විසින් මෙම වාර්තාවේ විස්තර කර ඇති උපායමාර්ගික ප්‍රමුඛතා නවය දරා සිටිනු ඇත.

**ඩිජිටල් පරිවර්තනයේ ශීඝ්‍රගාමී ගමන**

පසුගිය වසරේ සිදු කළ ප්‍රධාන ERP පද්ධති ස්ථාපනයෙන් පසුව, 2024/25 වසරේදී මෙහෙයුම් අඛණ්ඩතාව සහතික කරමින්, වෙනස්කම්වල සංකීර්ණතා සාර්ථකව කළමනාකරණය කිරීමට අපට හැකියාව ලැබුණි. අපගේ කණ්ඩායමේ කැපවීම නිසා පළමු අදියර ස්ථාවරව ප්‍රශස්තකරණය කිරීමට ද හැකි විය. 2025/26 වසරේදී ERP පද්ධතියේ දෙවන අදියර දියත් කිරීමට අප කටයුතු කරන්නෙමු. මෙම ඊළඟ අදියර මඟින් අපගේ අභ්‍යන්තර මෙන්ම බාහිර කොටස්කරුවන්ගේ අත්දැකීම් ප්‍රවර්ධනය සඳහා වටිනාකම් එක් කරන කාර්යයන් රැසක් හඳුන්වා දීමට බලාපොරොත්තු වන්නෙමු.

ඊට සමගාමීව, පාලනයන් ශක්තිමත් කිරීමට, කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට, තත්‍ය කාලීන දත්තවල නිරවද්‍යතාව සහතික කිරීමට, සහ කොටස්කරුවන්ගේ අත්දැකීම් වැඩිදියුණු කිරීම වෙනුවෙන් අප අභ්‍යන්තර මෙහෙයුම් හරහා ඩිජිටල්කරණ ව්‍යාපෘති කිහිපයක් ආරම්භ කළෙමු. විශේෂිත පරිවර්තන කණ්ඩායමක් දැන් ව්‍යාපාරික ඒකක සමඟ එක්ව ඩිජිටල් සහ කෘත්‍රිම බුද්ධිය මඟින් මෙහෙයවන නවෝත්පාදන මූලපිරීම් ක්‍රියාත්මක කරයි. මේවා මගින් ඉදිරි වසරේදී සහ ඉන් ඔබ්බට ස්ථිරසාර ප්‍රතිලාභ අපේක්ෂා කරන්නෙමු.

**දරාගැනීමේ හැකියාව සහ අනාගතය ගොඩනැගීම පිළිබිඹු කළ වසරක්**

මූල්‍ය වර්ෂයේ දෙවන භාගය වන විට, ඉදිකිරීම් කටයුතු යථා තත්ත්වයට පත්වීම සහ වාහන ආනයන තහනම ඉවත් කිරීමත් සමඟ ආර්ථික ප්‍රවණතාව වෙනස් වීම ඇරඹිණි. මෙම වර්ධනයේ පූර්ණ බලපෑම 2025/26 මූල්‍ය වර්ෂයේදී සාක්ෂාත් කරගැනීමට හැකිවනු ඇති අතර, මෙම වසරේ අපගේ කාර්යසාධනය අපගේ කණ්ඩායම්වල දරාගැනීමේ හැකියාව සහ නොපසුබට උත්සාහය පෙන්නුම් කරයි.

වෙළඳපොළ තත්ත්වයන් සීමා සහිත වුවද, සංචාරක අංශය පෙර වසරට වඩා ඉහළ මූල්‍ය කාර්යසාධනයක් මෙම වසරේදී වාර්තා කළේය. අපගේ දේශීය වාහන එකලස් කිරීමේ මෙහෙයුම් සහ උපායමාර්ගික ආනයන දීමනා උපයෝගී කර ගනිමින්, වාහන ආනයන සීමා කිරීම් පැවති කාලය තුළ පවා අපි පාරිභෝගික අවශ්‍යතා සපුරාලීමට සහ මෙහෙයුම් ක්‍රියාකාරීව පවත්වා ගැනීමට කටයුතු කළෙමු. මෑතකදී විද්‍යුත් වාහන හඳුන්වා දීම හේතුවෙන්, අපගේ සමූහයේ තිරසාරත්ව අරමුණු සඳහා සහය වීමට සහ ඉදිරි වසරේදී වඩා හොඳ කාර්යසාධනයක් ලබා දීමට මෙම අංශය දැන් හොඳින් සූදානම්ව ඇත.

සමූහයේ ක්‍රියාකාරිත්වයේ ප්‍රධාන අංගයක් ලෙස මෝටර් රථ ඉංජිනේරු විසඳුම් අංශය පැවති අතර, මෙම වසර සඳහා සමූහයේ බදු ලාභයට ඉහළම දායකත්වය ලබා දෙන ලදී.

මූල්‍යමය ප්‍රතිඵලවලට අමතරව, වාහන ආනයන තහනම හේතුවෙන් අපගේ වටිනා පාරිභෝගිකයන්ට ඔවුන්ගේ රථවාහන අලුත් කර ගැනීමට හැකියාවක් නොතිබූ නමුත් පිරිවැය-කාර්යක්ෂමව ඒවා පවත්වාගෙන යාමට අවශ්‍ය වූ අවස්ථාවකදී, ඔවුන්ගේ අත්‍යවශ්‍ය රථවාහන නඩත්තු අවශ්‍යතා අප විසින් සපුරාලනු ලැබීය. එමගින් අපගේ සේවා වටිනාකම් තවදුරටත් ශක්තිමත් විය. මෙම අංශය තුළ ඇති අධ්‍යාපන අංශය යොවුන් වියේ අයට වෘත්තීය මාවත් හෙළි කරමින් ප්‍රගතියක් ලබා ඇති අතර, එය 2025/26 මූල්‍ය වර්ෂය සඳහා ව්‍යාප්ත කිරීම ද සැලසුම් කර ඇත.

ගෘහස්ථ වියදම් අඩුවීම සහ ආන්තික පීඩනය හේතුවෙන් අභියෝගයන්ට මුහුණ දුන්නද, සිල්ලර අංශය පෙර වසරට වඩා ඉහළ මූල්‍ය කාර්යසාධනයක් මෙම වසරේදී වාර්තා කළේය. බොහෝ ආදායම් මාර්ගවල ක්‍රියාකාරීත්වය පීඩනයට ලක්ව තිබියදීත්, මෝටර් රථ අමතර කොටස් සහ ටයර් මගින් ලත් ආදායම, වර්ධනය වෙනුවෙන් ප්‍රමුඛ කාර්යයක් ඉටු කළේය. වෙළඳපොළේ වත්මන් ඉල්ලීම්වලට ගැළපෙන පරිදි, මෙම අංශය ව්‍යුහාත්මක වෙනස්කම්වලට භාජනය වූ අතර, විකුණුම් මෙහෙයුම් ප්‍රතිසංවිධානය කරන ලදී. ඉදිරි වසරේදී වඩාත් ශක්තිමත් ප්‍රතිඵල ලබාදීම සඳහා, උපායමාර්ගික සැපයුම් දාමය ප්‍රතිසංවිධානය සහ ක්‍රියාවලි වැඩිදියුණු කිරීම් අපේක්ෂා කරන්නෙමු. මෙම අංශයේ රසායනික ද්‍රාවණ අංශය මූල්‍ය කාර්යසාධනය අතින් මෙන්ම, එම ක්ෂේත්‍රය තුළ ඇති විවිධ අවස්ථා ඔස්සේ තිරසාර නිෂ්පාදන නවෝත්පාදන තුළින් ද වර්ධනයක් සැලසුම් කර ඇත.

වසර තුළ පිරිවැටුම ඉහළ ගියද, අහිතකර දේශගුණික තත්ත්වයන් සහ කෘෂි යෙදවුම් ආදායම් මාර්ගවලට බලපෑ දැඩි මිල තරඟය හේතුවෙන් කෘෂිකර්ම අංශය සමූහයේ වාර්ෂික ලාභයට සෘණාත්මක දායකත්වයක් ලබා දෙන ලදී. එසේ වුවද, මෙම කර්මාන්තයේ ඇති විභවය, සමූහයේ උපාය මාර්ගික සැලසුම් සමස්තයට හා කර්මාන්තයට ලැබෙන තිරසාර දායකත්වය අගය කරමින්, මෙම වසර තුළ නව මුලපිරීම්, කෘෂි තාක්ෂණය වෙනුවෙන් සහ එම අංශය තුළ ඇති දියුණුව සඳහා තවදුරටත් ප්‍රාග්ධන වියදම් ආයෝජනය කරන ලදී. අපගේ දේශීයව නිෂ්පාදිත වටිනාකම, එකතු කළ නිෂ්පාදන සමඟින් වර්ෂය තුළ අපි අපනයන වෙළඳපොළට පිවිසුන අතර, 2025/26 කාලය තුළ මෙම ක්ෂේත්‍රය ධනාත්මක පරිවර්තනයක් දැකීමට බලාපොරොත්තු වන්නෙමු. මෙම අංශයේ අනාගතය පිළිබඳව අප විශ්වාසයෙන් පසුවන අතර, 2025/26 මූල්‍ය වර්ෂයේදී සහ ඉන් ඔබ්බට එහි පූර්ණ ශක්තිය මුදා හැරීමට කැපවී සිටින්නෙමු.

ඉදිකිරීම් අංශය නැවතත් වේගවත්වීමත් සමඟ, යටිතල පහසුකම් ඉංජිනේරු අංශය, පුනර්ජීවනය සඳහා සූදානම්ව සිටින බව පැහැදිලිය. 2025/26 මූල්‍ය වර්ෂය සඳහා ඇති ව්‍යාපෘති පෙළ මෙම අංශයේ කාර්යසාධනය පිළිබඳව නව බලාපොරොත්තු දල්වයි.

වෛද්‍ය උපකරණ සඳහා වූ ඉල්ලුම අඩුවීම හේතුවෙන් සෞඛ්‍ය සේවා අංශයට අභියෝග රැසකට මුහුණ දීමට සිදු විය. ඖෂධ සහ පරිභෝජන ද්‍රව්‍ය යන අංශ හරහා කාර්යසාධනය නැවත පණ ගැන්වීම වෙනුවෙන් අප උත්සාහයන් දරමින් සිටින්නෙමු.

විදුලි ඉංජිනේරු සහ ගොඩනැගිලි තාක්ෂණ අංශය, සමූහය තුළ ශක්තිමත් දායකත්වයක් ලබා දෙමින්, මෙම වසරේදී පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රයේ ප්‍රධාන පියවරක් තැබීය. විදුලි ඉංජිනේරු සහ ගොඩනැගිලි විසඳුම් සිදු කරන ප්‍රධාන ව්‍යාපෘතිවලට අමතරව, පුනර්ජනනීය බලශක්ති සමස්තය සැලකිය යුතු දියුණුවක් ලබා ගන්නා ලදී. එය මූල්‍යමය වශයෙන් මෙන්ම අපගේ දිගුකාලීන තිරසාර ඉලක්ක සඳහා ද දායක විය.

එළඹෙන වසර සඳහා අපගේ සැලසුම් සම්බන්ධයෙන් අපි විශ්වාසයෙන් පසුවන්නෙමු. මේ වසරේ එක් එක් අංශය තුළ ගොඩනැගුණු වේගය සහ අපගේ නව ඇරඹුම් ඔස්සේ වෙළඳපල අවස්ථා ප්‍රයෝජනයට ගනිමින් ශක්තිමත්ව යළි නැගී සිටීමටත්, එමගින් අපගේ සමූහයේ මූල්‍ය කාර්ය සාධනය ධනාත්මකව වර්ධනය කිරීමටත් අප බලාපොරොත්තු වන්නෙමු.

**මෙහෙයුම් ප්‍රමුඛතා**

සමාලෝචනය කරන ලද වසර තුළ අපගේ කාර්යසාධනය පිළිබඳව විමසිලිමත්ව බැලීමේදී, ඉදිරි වසරේදී විශේෂ අවධානයක් සහ ක්‍රියාමාර්ග අත්‍යවශ්‍ය වන ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍ර කිහිපයක් අප හඳුනාගත්තෙමු. ලාභ ආන්තික කළමනාකරණය, මෙහෙයුම් ප්‍රාග්ධනය ප්‍රශස්තකරණය සහ පොදු වියදම් පාලනය සඳහා නව ව්‍යුහයන් හා ක්‍රියාවලීන් ප්‍රශස්තකරණය කිරීම මෙහෙයුම් ප්‍රමුඛතා ලෙස මතුවී ඇත. මේවා අපගේ වර්ධන අරමුණු සම්පූර්ණ කරමින් මෙහෙයුම් ලාභදායිත්වය සහ මුදල් ප්‍රවාහ කළමනාකරණය ශක්තිමත් කිරීමට උපකාරී වේ. මෙම අවධානය යොමු කළ ක්ෂේත්‍රවලට මුලපිරීම ක්‍රියාත්මක කිරීම සඳහා කැපවූ කණ්ඩායම් පෙළගස්වා ඇත.

**අනාගතය වෙත වේගවත් ගමනක**

අප අනාගතය දෙස බලන්නේ පැහැදිලි දැක්මක් සහ අරමුණක් සහිතවය. අපගේ පරිවර්තනීය ගමන අපගේ උපායමාර්ගික පදනම් සහ උපායමාර්ගික ප්‍රමුඛතා නවය (22 පිටුව) මත ගොඩනැගී තිබේ.

මෙම මං සැලැස්ම ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා, අපි අපගේ අලෙවිකරණය, මානව සම්පත්, තොරතුරු තාක්ෂණය සහ මූල්‍ය යන මූලික කාර්යයන් අප ප්‍රතිසංවිධානය කරමින් සිටින්නෙමු. මෙය වඩාත් තීව්‍ර වෙළඳපල සංවර්ධනයක් සඳහාත්, ඩිජිටල්කරණය මෙහෙයවීමටත්, නැගී එන මානව සම්පත් හා සංස්කෘතික වෙනස්වීම් අවශ්‍යතා සමඟ ගැළපීමටත්, නවෝත්පාදනයට හා වර්ධනයට සහය වීමටත් උපකාරී වේ.

සමූහයේ නිශ්චිත තිරසාරත්ව න්‍යාය පත්‍රය සහ අවදානම් කළමනාකරණ රාමුව මඟින් මඟ පෙන්වනු ලබන මෙම උපායමාර්ග, ගොඩනඟා ගත් ගම්‍යතාව සමඟින් අනාගතය වෙත වේගයෙන් ඉදිරියට යාමට අපව සූදානම් කර ඇත.

**වටිනාකම් දාමයෙහි ප්‍රමුඛතා**

වේගවත් වර්ධනයක් සහ උපායමාර්ගික පරිවර්තනයක් සඳහා අපගේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස, සියලු කොටස්කරුවන් සඳහා කල් පවතින වටිනාකමක් නිර්මාණය කිරීමට අපි ස්ථිරසාර ලෙස කැපවී සිටින්නෙමු. මෙම ගමනේ ප්‍රධාන සාධකයක් ලෙස, අප සංවිධානයේ සෑම අංශයකම වටිනාකම් දාමයන් ප්‍රශස්තකරණය කෙරෙහි අවධානය යොමු කළෙමු.

අපගේ ERP පද්ධතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සහ මෙහෙයවීම සමඟ සමපාත වන පරිදි, අපගේ වටිනාකම් දාමයන් ඉතා සැලකිල්ලෙන් සැලසුම් කිරීමට සහ විධිමත් කිරීමට අපි ඒකාබද්ධ උත්සාහයන් දරා ඇත්තෙමු. ප්‍රධාන කාර්යයන්, ක්‍රමානුකූලව කේන්ද්‍රගත කිරීම වෙනුවෙන් උපායමාර්ගිකව නැවත ස්ථානගත කර ඇත.

තොරතුරු ප්‍රවාහ යාන්ත්‍රණ වැඩිදියුණු කර ඇති අතර, එමඟින් කඩිනම් තීරණ ගැනීමේ හැකියාව සහ සමස්ත ව්‍යාපාරය පුරා වඩාත් තීව්‍ර පාරිභෝගික අවධානයක් සක්‍රීය කිරීමට හැකියාව ලැබී ඇත. මෙය වඩා දියුණු පාරිභෝගික අත්දැකීම් වෙනුවෙන් අපව යොමු කරනු ලබයි.

**වගකීම් පෙරදැරිව**

අපගේ අරමුණ සහ සන්නාම පොරොන්දුව කෙරෙහි අප දක්වන උනන්දුව සහ කැපවීම, පාලනය, අවදානම් සහ අවස්ථා කළමනාකරණය පිළිබඳ ශක්තිමත් රාමුවක් ඇතුළත නිරතුරුවම රඳා පවතී. මෙම රාමු මඟින් ආයතනික පාලනය, තොරතුරු තාක්ෂණ හා සයිබර් ආරක්ෂණ පාලනය, සහ තිරසාරත්ව පාලනය යන සියල්ල ආවරණය කරයි. අපගේ මෙහෙයුම් සිදු කරන ව්‍යුහය මෙමගින් සකස් කරනු ලබයි.

DIMO වටිනාකම්, අඛණ්ඩ ප්‍රතිපත්ති හා පිළිවෙත් සංවිධානය පුරා තදින් මුල් බැසගෙන ඇත. අවිනිශ්චිතතාවන්ට පූර්වයෙන් මුහුණ දීම සඳහා අපගේ අවදානම් හා අවස්ථා කළමනාකරණ පද්ධති වැඩිදියුණු කර ඇති අතර, තිරසාරත්වය උපායමාර්ගික තීරණ තුළට අන්තර්ග්‍රහණය කිරීමට ද කටයුතු කර ඇත.

**සේවක අත්දැකීම් වැඩි දියුණු කිරීම: පාරිභෝගික අත්දැකීම් සවිබල ගැන්වීම**

අප විශ්වාස කරන්නේ, සෑම විටම හා සෑම අවස්ථාවකදීම අපගේ වටිනා සේවකයන් විසින්ම අපගේ අරමුණු ඉටු කරවන බවයි. DIMO තුළ, උසස් සහ කල්පවතින පාරිභෝගික අත්දැකීමක් ලබා දීම ආරම්භ වන්නේ ඉහළින්ම කැපවූ, බලයලත් සහ තෘප්තිමත් සේවක පිරිසක් ගොඩනැගීමෙන් බව අපි තරයේ විශ්වාස කරමු. මෙම විශ්වාසය අපගේ අඛණ්ඩ පරිවර්තන න්‍යාය පත්‍රයේ මූලිකාංගයක් වී ඇත.

ඒ සඳහා, අප හැකියාවන්ගේ සාකල්‍ය සංවර්ධනයට හා රඳවා ගැනීමට ප්‍රමුඛත්වය දී ඇති අතර, ඉගෙනීමට නැඹුරු වූ සංස්කෘතියක් පෝෂණය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින්, සෑම මට්ටමකදීම පාරිභෝගික විශිෂ්ටත්වය සඳහා වගවීම ඇති කර තිබේ. වැඩිදියුණු කළ ඉගෙනුම් සහ සංවර්ධන මැදිහත්වීම් ඇතුළු ප්‍රධාන මුලපිරීම් දැනට ක්‍රියාත්මක වේ.

**සහතික කිරීම්**

DIMO තුළ, අප අපගේ කොටස්කරුවන් වෙත වූ මූලික කැපවීමක් ලෙස විනිවිදභාවය ඉහළින්ම අගය කරන්නෙමු. ආචාරධර්මීය හැසිරීම් සහ තොරතුරු හෙළිදරව් කිරීමේ ඉහළම ප්‍රමිතීන් පවත්වා ගනිමින්, අපගේ ආයතනික වාර්තාවල ඉදිරිපත් කර ඇති සියලුම තොරතුරුවල සත්‍යතාව සහ විශ්වසනීයත්වය අපි සහතික කරන්නෙමු. මෙම ඒකාබද්ධ වාර්ෂික වාර්තාව එම කැපවීමේ පිළිබිඹුවකි. ව්‍යවස්ථාපිත ස්වාධීන විගණකවරුන්ගේ සහතික කිරීමට අමතරව, වාර්තාකරණ සැකසුම [5 වන පිටුවෙහි] සඳහන් කර ඇති පරිදි තොරතුරු හෙළිදරව් කිරීම් සඳහා අපි තෙවන පාර්ශ්වීය සහතික කිරීමක් ද ලබාගෙන ඇත්තෙමු.

**තිරසාරත්වය සහ ESG කැපවීම**

අපගේ උපායමාර්ගික අවශ්‍යතා සමඟ සමපාත වෙමින්, පාරිසරික, සමාජීය සහ පාලන (ESG) කරුණු ව්‍යාපාර ආකෘතියට අන්තර්ග්‍රහණය කරමින් අපගේ තිරසාරත්ව න්‍යාය පත්‍රය ඉදිරියට ගෙන යාමට අප කටයුතු කරන්නෙමු. අපගේ 'තිරසාරත්ව න්‍යාය පත්‍රය 2030' මගින් මූල්‍ය වර්ධනය පවත්වා ගනිමින්, සමාජයට සහ පරිසරයට ධනාත්මකව දායක වීම සඳහා වන අපගේ දිගුකාලීන දැක්ම සහ නිශ්චිත ඉලක්ක ගෙනහැර දක්වනු ලබයි.

මෙම වසරේ වාර්තාව අපගේ ප්‍රධාන ESG කාර්යසාධන දර්ශක සහ අප ලබා ඇති ප්‍රගතිය විස්තර කරනු ඇත. දේශගුණික අවදානමේ ඉහළ යන වැදගත්කම හඳුනා ගනිමින්, දේශගුණික අභියෝගයන්ට ඉක්මන් සහ අරමුණු සහගතව මුහුණ දීමෙන් වගකිවයුතු ආයතනික පුරවැසියෙකු ලෙස අපගේ භූමිකාව යළි තහවුරු කරන්නෙමු.

විශ්වාසනීයව අනාගතය දෙස බැලීම.

අපි 2025/26 මූල්‍ය වර්ෂයට පිවිසෙන්නේ පැහැදිලි දැක්මක්, සුබවාදී බවක් සහ අරමුණක් සහිතවයි. අප පෙන්වූ දරාගැනීමේ හැකියාව, ගොඩනඟා ගත් ගම්‍යතාව සහ සිදු කරන ලද උපායමාර්ගික ප්‍රතිසංවිධානය අනාගත සාර්ථකත්වය සඳහා අපව හොඳින් ස්ථානගත කරනු ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය සහ නායකත්ව කණ්ඩායම වෙනුවෙන්, අපගේ සේවකයන්ට, හවුල්කරුවන්ට, පාරිභෝගිකයින්ට සහ කොටස්කරුවන්ට අපගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි. ඔබගේ අඛණ්ඩ විශ්වාසය සහ සහයෝගය අපව ඉදිරියට ගෙන යාමට පෙළඹවීමක් ඇති කරයි. එය හුදු ප්‍රගතියක් පමණක් නොව, පරිවර්තනය,

සාමූහික වර්ධනය සහ දිගුකාලීන වටිනාකම් නිර්මාණය මගින් අර්ථාන්විත අනාගතයක් කරා වේගයෙන් ගමන් කිරීමට අධිෂ්ඨානය සපයයි.

ඔබේ විශ්වාසී

A. G. පණ්ඩිතගේ
සමූහ කළමනාකාර අධ්‍යක්ෂ/
ප්‍රධාන විධායක නිලධාරී

2025 ජූනි 05